**නාවලපිටිය නගර සභාව - 2023**

**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

නාවලපිටිය නගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට නාවලපිටිය නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතී,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාතර්ාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ ගබඩාවෙන් නිකුත් කළ රු.307,470 ක භාණ්ඩ ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

**1.6.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාතර්ා**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට මූල්‍ය ප්‍රකාශන අනුව ගබඩා භාණ්ඩ ශේෂය රු.5,468,613 ක් වූ අතර උපයෝගී ලේඛන අනුව එය රු.4,678,438 ක් වූයෙන් රු.790,175 ක වෙනසක් විය. | වෙනස සොයා බලා නිවැරදි කරන බව. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |

**1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.13,413,346 ක වත්කම් ශේෂ 07 කට අදාළ උප ලේඛන, ශේෂ සනාථ ලිපි, කර්මාන්ත ලිපි ගොනු, තහවුරු කිරීම් ලිපි, ගිණුම් හා මෘදුකාංගයේ පැවත එන ශේෂයට තහවුරු කිරීමේ ලේඛන ඉදිරිපත් නොකිරීම නිසා ඒවා සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | සොයා බලා නිවැරදි කරන බව | එක් එක් ගිණුම් ශේෂයන් තහවුරු කිරීමට අදාළ ලේඛන, ලිපිගොනු හා උපලේඛන පවත්වාගත යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | නගර සභා ආඥා පනතේ 34 (අ) වගන්තිය | අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව සභාවට අයත් බච්චාගම ඉඹුල්පිටිය වත්ත ඉඩමෙහි අක්කර 16 රූඩ් 01 පර්චස් 9.27 ක ප්‍රමාණයක බදු ගිවිසුම් යටතේ 2010 වර්ෂයේ සිට පුද්ගලයින් 143 දෙනෙකු පදිංචි කරවා තිබුණි. | සමීක්ෂණය සිදුකර ඉදිරි කටයුතු සිදුකරන බව | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| (i) | මුදල් රෙගුලාසි 371 (2) | අග්‍රිමයන් දෙන ලද කාර්යය නිම කළ විගසම පියවීමට කටයුතු කළ යුතු වුවත් 2016 සිට 2022 වර්ෂවලදී ලබා දී තිබූ එකතුව රු. 139,999 ක අත්තිකාරම් 04 ක් සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් පියවීමට කටයුතු කර නොතිබුණි. | කඩිනමින් නිරවුල් කරන බව. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි 571 (3) | 2016 – 2020 අතර කාල පරාසයට අදාළ රු. 1,034,041 ක කාලය ඉකුත් වූ තැන්පත් 26 ක් නිරවුල් කර නොතිබුණි. | කඩිනමින් නිරවුල් කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2016 | වාහන 11 ක 2017 - 2022 කාලයක සිට ඉන්ධන දැවීම පරීක්ෂා කර නොතිබුණි. | කඩිනමින් සිදු කරන බව. | චක්‍ර ලේඛ අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.44,102,141 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.39,334,039 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම් විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 14,422,500 | 14,280,765 | 14,453,260 | 19,018,664 | 14,556,530 | 13,347,331 | 13,726,250 | 19,191,159 |
| (ii) | කුලී | 47,679,000 | 47,677,525 | 25,780,445 | 140,000,766 | 45,855,195 | 46,718,659 | 20,711,891 | 118,103,686 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 875,000 | 1,336,250 | 1,336,250 | - | 590,000 | 536,450 | 536,450 | - |
| (iv) | වෙනත් ආදායම් | 8,850,000 | 9,597,300 | 8,128,564 | 13,784,203 | 5,300,000 | 5,300,000 | 3,431,678 | 12,315,467 |
| | | 71,826,500 | 72,891,840 | 49,698,519 | 172,803,633 | 66,301,725 | 65,902,440 | 38,406,269 | 149,610,312 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

**සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධන සම්බන්ධ නිරීක්ෂණ දැක්වේ.**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් බදු**<br>සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟ වරිපනම් බදු ශේෂය රු.17,831,727 ක් වූ අතර, ඒකකයක වරිපනම් බදු හිඟය රු.10,000 ඉක්මවූ වරිපනම් ඒකක 321 කින් එකතුව රු.11,593,014 ක් විය. | දේපල තහනම් කිරීම මඟින් හිඟ මුදල් අයකරන බව. | පනතේ විධිවිධාන අනුව කටයුතු කර ආදායම් අය කළ යුතුය. |
| (ආ) | **කඩ කුලී**<br>සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.134,558,962 ක කඩ කුලී හිඟ ශේෂයක් පැවති අතර එතුල කඩ කුලී හිඟය රු.100,000 ක් ඉක්මවූ කඩ කාමර 51 කින් රු.27,213,122 ක් හිඟව පැවතුණි. එමෙන්ම සුපිරි වෙළඳ සංකීර්ණයේ හිඟ ශේෂය රු.106,075,964 ක් පැවති අතර 2018 වර්ෂයේ සිදුකළ තක්සේරුව මත වූ කුලී වැඩි කිරීම හේතුවෙන් කඩ හිමියන් කුලී ගෙවීම පැහැර හැර තිබුණි. නගර සභාව ඊට එරෙහිව 2019 වර්ෂයේ නඩුවක් ගොනුකර තිබුණි. වෙළඳ සංකීර්ණය පිහිටි භූමියේ අයිතිය පිළිබඳ නීත්‍යානුකූල ලියවිලි නොමැති වීම හේතුවෙන් නඩුව අවසන්ව නොතිබුණි. ගම්පොළ පාරේ හට් කඩ කාමර කඩ 03 කින් සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.527,600 ක මුදලක් හිඟව පැවතිණි. භූමියේ | නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව | හිඟ මුදල් අය කළ යුතුය. |

| | | |
|---|---|---|
| අයිතිය සභාව සතු කොත්මලේ පාර කඩ කාමර 49 ක් හා සුපිරි වෙළඳසැල අසල කඩ 07 ක් සඳහා 2018 වර්ෂයේ සිදුකල නව තක්සේරුවට අනුව බදුකරුවන් විසින් කඩ කුලී ගෙවීම පැහැර හැරීම හේතුවෙන් රු.24,797,439 ක හිඟයක් පැවතුණි. | | |

(ඈ) **වෙනත් ආදායම්**

| | | | |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට ජල ගාස්තු හිඟය රු.845,973 ක් වූ අතර එම හිඟය වසර 03 ත් 05 ත් අතර කාල පරාසයක සිට පැවතුණි. | කපා හැරීමට කටයුතු කරන බව. | හිඟ ජල ගාස්තු අයකර ගත යුතුය. |
| (ii) | 2008 හා 2021 වර්ෂවලදී සභාව සතුව පැවති ජල ව්‍යාපෘති 02 ක් ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට හා ප්‍රජා ජල සමිතියකට පවරා දී තිබුණද එදිනට පැවති හිඟය රු.707,374 ක් හා 138,600 ක් අයකරගෙන නොතිබුණි. | හි ඟ අයකිරීමට කටයුතු කරන බව. | හිඟ ජල ගාස්තු අයකළ යුතුය. |
| (iii) | 2020 සිට සමාලෝචිත වර්ෂය දක්වා කාලයට අදාළ හිඟ දැන්වීම් පුවරු ගාස්තු රු.894,970 ක් අයකරගෙන නොතිබුණි. | හිඟ අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ගාස්තු අයකර ගත යුතුය. |
| (iv) | අනුමත රථවාහන පාලක තනතුරු 02 ක් තිබුණද විධිමත් පරිදි වාහන නැවතුම්ගාස්තු අය කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන දිනට වාහන අංගන 31 කින් රු.5,687,444 ක හිඟ ගාස්තු අයකර නොතිබුණි. | හිඟ අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ගාස්තු අයකර ගත යුතුය. |
| (v) | 2019 – 2021 කාල පරිච්ඡේදයට අදාළ සභාව සතුව පවතින ක්‍රීඩා සංකීර්ණය සහ නේවාසිකාගාර පහසුකම් ලබාගත් ආයතන 03 කින් රු.1,685,820 ක් අයකර නොතිබුණි. | හිඟ අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ගාස්තු අයකර ගත යුතුය. |

**(ඈ) උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.374,750 ක් හා මුද්දර ගාස්තු රු.9,064,800 ක් විය. | උපලේඛන අනුව ගිණුම්වල ගැලපීම් සිදුකරන බව. | උසාවි දඩ හා මුද්දර ගාස්තු ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂවල පුනරාවර්තන ආදායම් ප්‍රාදේශීය සංවර්ධනයට යොදවා ගැනීමකින් තොරව රු.16,758,846 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. | සූරිය පැනල සවි කිරීම සඳහා යොදා ගැනීමට කටයුතු කරන බව. | ආදායම් ඉපැයීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සභාව විසින් එකතු කරනු ලබන කසළ ප්‍රතිචක්‍රීයකරණය කර කාබනික පොහොර නිෂ්පාදනය කරනු ලබන අතර සමාලෝචිත වර්ෂය තුළ පොහොර කි.ග්‍රෑම්.31,450 ක් නිෂ්පාදනය කර තිබුණද අලෙවිය කි.ග්‍රෑම්.4,886 ක් විය. ඒ අනුව කාබනික පොහොර රු.212,512 ක තොගයක් භාවිතයට ගැනීමකින් තොරව කසළ අංගනයේ අවිධිමත්ව ගොඩගසා විනාශවීමට ඉඩහැර තිබුණි. | විධිමත් වැඩසටහනක් සකස් කරමින් පවතින බව. | කසළ කළමනාකරණය කළ යුතුය. |

### 3.2 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 – 2021 වර්ෂවල හඳුනාගත් වරිපනම් මෘදුකාංගයේ සිදුවී ඇති අක්‍රමිකතාවය වූ රු.1,431,151 ක් සම්බන්ධයෙන් 2022 පෙබරවාරි 21 දින පරීක්ෂණ ඇරඹී තිබූ නමුත් වරද හඳුනාගෙන වසර 02 1/2 ක කාලයක් ගතවුවද ඊට අදාළව පොලීසියේ පැමිණිල්ලක් හෝ මු.රෙ.104(3) හා මු.රෙ.104(4) පරීක්ෂණ සිදුකර නොතිබුණි. | පොලිස් පැමිණිල්ලක් සිදුකිරීමට පියවර ගන්නා බව | මුදල් රෙගුලාසි අනුව කඩිනමින් අදාළ පරීක්ෂණ සිදුකළ යුතුය. |
| (ආ) | හිටපු සභාපතිවරයා භාවිතා කළ කැබ් රථය 2022 මැයි 09 වන දින අනතුරට පත්වී තිබූ අතර අලාභයේ දළ ඇස්තමේන්තුව රු.9,500,000 ක් තක්සේරු කර තිබුණද, ඊට අදාළ මු.රෙ.104(3) හා මු.රෙ.104(4) පරීක්ෂණ සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් සිදුකර නොතිබුණි. | මු.රෙ පරීක්ෂණ සඳහා යොමු කර ඇති බව. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව දෛනික වැටුප් ගෙවීමේ පදනම මත 2013 – 2019 කාලය තුළ බඳවාගත් සේවකයින් 10 දෙනෙකුගේ රාජ්‍ය සේවක අර්ථසාධක අරමුදලට සේව්‍යාගෙන් හා සේවකයන්ගේ දායක මුදල් ප්‍රේෂණය නොකිරීම හේතුවෙන් සේවකයින් නඩු පවරා තිබූ අතර ඊට අදාළ නඩු තීන්දුව අනුව සේවකයාගේ සියයට 08 ක දායකය ද සභාවට දැරීමට සිදු වීම හේතුවෙන් වූ අලාභය රු.1,024,978 ක් විය. | පනතේ විධිවිධාන අනුව අදාළ මුදල් ගෙවූ බව. | සභාවට සිදු වූ අලාභය අයකරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | වට්නාකම හඳුනා නොගත් භාණ්ඩ ඒකක 211 ක ඌනතාවය හඳුනාගෙන තිබුණද ඒ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | අවශ්‍ය කටයුතු ඉදිරියේදී සිදුකරන බව | ඌනතාවයන් හඳුනාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 04 ක එකතුව රු.1,419,497 ක් වූ අතර, ඉන් වසර 1 ත් 5 ත් අතර කාලයට අදාළ ගිණුම් ශේෂ එකතුව රු.519,537 ක් හා වසර 5 කට වැඩි කාලයක් පවතින එකතුව රු.859,330 ක් විය. | නීත්‍යානුකූලව අයකර ගැනීමට කටයුතු කරන බව. | ලැබිය යුතු ශේෂයන් අයකළ කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 02 ක එකතුව රු.3,547,367 ක් වූ අතර ඉන් වසර 1 ත් 5 ත් අතර කාලයට අදාළ ගිණුම් ශේෂ එකතුව රු.1,113,863 ක් හා වසර 5 කට වැඩි කාලයක් පවතින එකතුව රු.731,290ක් විය. | නිරවුල් කිරීමට කටයුතු කරන බව. | ගෙවිය යුතු ශේෂයන් නිරවුල් කළ යුතුය. |
| (ඇ) | 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ විධිවිධාන අනුව සංවර්ධන අවසර පත්‍රයක් ලබා ගෙන ගොඩනැගිලි ඉදිකළ යුතු වුවත්, ඊට පරිභාහිරව ඉදිකර තිබූ ගොඩනැගිලි 06 ක් සම්බන්ධයෙන් සභාව කිසිදු ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබුණි. | අඩුපාඩු සකස් කිරීමට කටයුතු කරන බව | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ඈ) | ඉන්වෙන්ට්‍රි ලේඛන හා භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව ශේෂයන් ස්ථාවර වත්කම්වල ශේෂයන් සසඳා ඊට අදාළ ශේෂයන් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කල යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට පැවති යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ රු.23,731,104 ක් හා ලී බඩු හා සවි කිරීම් රු.30,581,211 ක් ඉකුත් වර්ෂයේ ශේෂයන්ට මිලදී ගැනීම් හා ඉවත් කිරීම් ගලපා මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර තිබුණි. | ඉදිරියේදී ගැලපුම් සිදුකිරීම කරන බව. | නිවැරදිව ලේඛන පවත්වා ගත යුතුය. |

## 3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට පැවති එකතුව රු.4,260,750 ක ට්‍රැක්ටර් හා ට්‍රැක්ටර් ට්‍රේලර 13 ක් වසර 03 සිට වසර 10 දක්වා | අලුත්වැඩියා කිරීමටත් වෙන්දේසි කිරීමටත් කටයුතු කරන බව. | අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ භාවිතයට ගත නොහැකි වත්කම් අපහරණය |

| | | |
|---|---|---|
| කාල පරාසයක සිට නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිතව පැවතුණි. | | කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.5 වත්කම් කළමනාකරණය

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සභාව පරිහරණය කරන ඉඩම් කොස් 45 ක හා කැබ්රථයක නීත්‍යානුකූල අයිතිය පවරාගෙන නොතිබුණි. | මෙම ඉඩම පවරා ගැනීමට කටයුතු කරන බව. | අයිතිය පවරා ගත යුතුය. |

### 3.6 මානව සම්පත් කළමනාකරණය

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | අනුමත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්යමණ්ඩලය සැසඳීමේදී ඉන් තනතුරු 14 ක පුරප්පාඩු 29 ක් ද තනතුරු 03 ක අතිරික්තතා 11 ක් ද පැවතුණි. | මාසික කාර්ය මණ්ඩල තොරතුරු වාර්තා මඟින් පුරප්පාඩු පිළිබඳව වාර්තා කර ඇති බව. | පුරප්පාඩු සම්පූර්ණ කරගත යුතුය. |
| (ආ) | 1988 - 2021 දක්වා කාලය තුළ විශ්‍රාම ගිය, ස්ථාන මාරුවී ගිය, සේවය හැර ගිය හා මිය ගිය නිලධාරීන් හා සේවකයින් 38 දෙනෙකුගෙන් එකතුව රු.937,252 ක ණය ශේෂයක් විය. | අයකරගැනීමට ක්‍රියාමාර්ග ගන්නා බව | ණය අයකර ගත යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

**තිරසර සංවධර්න අරමුණු**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනතේ නියමයන්ට අනුව සභාව විසින් තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන තිබුණද ඒවා ලඟාකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී කටයුතු කරන බව. | අරමුණු හා ඉලක්ක හඳුනාගෙන ක්‍රියාත්මක කළ යුතුය. |